විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු

# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
# பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
# OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / தொலைபேசி இலக்கம் / General Telephone - 011 - 2093000

SLSI SYSTEM CERTIFIED ISO 9001
SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01


මගේ අංකය / எனது இலக்கம் / My No. } CSWP/FIN-AP/03/FI/04
ඔබේ අංකය / உமது இலக்கம் / Your No. }
දිනය / திகதி / Date } 2022.12.14

## මූල්‍ය චක්‍රලේඛ 15/2022

ආණ්ඩුකාර ලේකම් (බ.ප.),
අමාත්‍යාංශ ලේකම්වරු (බ.ප.),
සභා ලේකම් (බ.ප.),
පළාත් කොමිෂන් සභාවල ලේකම්වරු (බ.ප.),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු (බ.ප.),
දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් (බ.ප.),
ව්‍යවස්ථාපිත අධිකාරිවල සභාපතිවරු (බ.ප.)

### රජයේ ආයතන විසින් විවිධ උත්සව සඳහා දරනු ලබන වියදම් අත්හිටුවීම.

භාණ්ඩාගාර ලේකම්ගේ 2022.11.25 දිනැති "රජයේ ආයතන විසින් විවිධ උත්සව සඳහා දරනු ලබන වියදම් අත්හිටුවීම" සම්බන්ධයෙන් නිකුත් කරන ජාතික අයවැය චක්‍රලේඛ අංක 08/2022 හි පිටපතක් මේ සමඟ අමුණා ඇත.

02. ආණ්ඩුකාර ලේකම්ගේ අංක GOS/ADM/6/2/19 හා 2022.12.02 දිනැති ලිපිය මඟින් ඉහත සඳහන් චක්‍රලේඛය බස්නාහිර පළාත් සභාවට අදාල කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇති බව දැනුම් දී ඇත. එහෙයින් චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

03. එමෙන්ම මෙම චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන ඒ අයුරින්ම ඉටු කිරීම සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්, නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා ව්‍යවස්ථාපිත ආයතනවල සියලුම සභාපතිවරුන්ගේ වගකීමක් බව වැඩිදුරටත් පෙන්වා දෙමි.

ජේ.එම්.සී. ජයන්ති විජේතුංග,
ප්‍රධාන ලේකම්,
පළාත් මුදල් අමාත්‍යාංශ ලේකම් හා
පළාත් භාණ්ඩාගාර ලේකම්,
බස්නාහිර පළාත

පිටපත: 01.විගණකාධිපති
02.අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන)
03.තොරතුරු තාක්ෂණ නිලධාරී


| නියෝජ්‍ය ප්‍රධාන ලේකම් / பிரதிப் பிரதான செயலாளர் / Deputy Chief Secretary | පාලන / நிர்வாகம் / Administration | පිරිස් හා පුහුණු / ஆளணி மற்றும் பயிற்சி / Personnel & Training | මූල්‍ය / நிதி / Finance | සැලසුම් / திட்டமிடல் / Planning | ඉංජිනේරු / பொறியியல் / Engineering | ප්‍රධාන අභ්‍යන්තර විගණක / பிரதான உள்ளகக் கணக்காய்வாளர் / Chief Internal Auditor |
|---|---|---|---|---|---|---|
| | Tel : 0112092606<br>Fax : 0112092609<br>dcsadmin@cs.wpc.gov.lk | Tel : 0112092631<br>Fax : 0112092647<br>dcspt@cs.wpc.gov.lk | Tel : 0112092640<br>Fax : 0112092636<br>dcsfinance@cs.wpc.gov.lk | Tel : 0112092532<br>Fax : 0112092533<br>dsplan@cs.wpc.gov.lk | Tel : 0112092501<br>Fax : 0112092505<br>dcs@eng.wpc.gov.lk | Tel : 0112092628<br>Fax : 0112092625<br>cia@cs.wpc.gov.lk |

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
நிதி; பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
MINISTRY OF FINANCE, ECONOMIC STABILIZATION AND NATIONAL POLICIES

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව | செயலகம், கொழும்பு 01, இலங்கை. | The Secretariat, Colombo 01, Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011-2484500, 011-2484600, 011-2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2449823
වෙබ් අඩවිය / இணையதளம் / Website: www.treasury.gov.lk


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No | BD/CBP/01/01/08/2022 | ඔබේ අංකය<br>உமது இல<br>Your No | | දිනය<br>திகதி<br>Date | 2022.11. 25 |

**ජාතික අයවැය චක්‍රලේඛ: 08/2022**

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්/දිස්ත්‍රික් ලේකම්වරුන්
රාජ්‍ය සංස්ථා, සමාගම් සහ ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්
රාජ්‍ය බැංකු ප්‍රධානීන්

**රජයේ ආයතන විසින් විවිධ උත්සව සඳහා දරනු ලබන වියදම් අත්හිටුවීම**

රාජ්‍ය වියදම් දැඩිව පාලනය කිරීමේ අරමුණින් නිකුත් කරන ලද අංක 03/2022 දරන 2022.04.26 දිනැති ජාතික අයවැය චක්‍රලේඛය මගින් රාජ්‍ය ආයතන මගින් පවත්වන උත්සව, විවෘත කිරීම්, සම්මන්ත්‍රණ ඇතුළු අනවශ්‍ය නොවන හා ප්‍රමුඛ නොවන වියදම් අත්හිටුවමින් ඒවා සඳහා රාජ්‍ය මුදල් භාවිතා නොකරන ලෙස නියම කර තිබේ. එම විධිවිධාන තරයේ පිළිපදින ලෙස ගරු ජනාධිපතිතුමාගේ උපදෙස් පරිදි ජනාධිපති ලේකම්වරයා විසින් අංක PS/SB/Circular/10/2022 දරන 2022.08.15 දිනැති චක්‍රලේඛය මගින් ද උපදෙස් ලබා දී ඇත. එමෙන්ම, අංක 04/2022 දරන 2022.08.08 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මගින් ද උත්සව කටයුතුවලට අදාලව වියදම් නොදැරිය යුතු බව දන්වා තිබේ.

02. මීට අමතරව, විවිධ උත්සව සඳහා රජයේ ආයතන විසින් රජයේ අරමුදල් වැය කිරීම සම්බන්ධයෙන් වන අංක 22/විවිධ(032) දරන 2022.06.13 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් ද පවතින සීමාකාරී මූල්‍ය අවකාශය තුළ රාජ්‍ය ආයතන විසින් සිය විෂයපථයට අදාල උත්සව මෙන්ම වෙනත් බාහිර උත්සව කටයුතු සඳහා අරමුදල් වැය කිරීම අත්හිටුවන ලෙස විධාන කර තිබේ.

03. එසේවුවද, ඉහත නියමයන්ට පටහැනිව තවදුරටත් එවැනි වියදම් දරනු ලබන බවට වාර්තා වන බැවින්, සියලුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා,සමාගම්, ව්‍යවස්ථාපිත මණ්ඩල, රාජ්‍ය ව්‍යවසායන්, පළාත් සභා, පළාත් පාලන ආයතන සහ රාජ්‍ය බැංකු විසින් සිදුකරනු ලබන විවෘත කිරීම්, නිලධාරීන් විසින් රාජකාරී භාරගැනීමට හා විශ්‍රාම ගැනීමට අදාළව පවත්වන උත්සව, සුහද හමුවීම්, ප්‍රියසම්භාෂණ ද ඇතුළුව සියලුම ආකාරයේ උත්සව පැවැත්වීම වෙනුවෙන් රජයේ හෝ ස්වකීය ආයතනවල ඉපයීම් භාවිතා කරමින් දරනු ලබන වියදම් නැවැත්වීමට කටයුතු කළ යුතු බව නැවත අවධාරණය කරමි.

04. සියලුම ආයතන ප්‍රධානීන් මෙම උපදෙස් තරයේ පිළිපැදිය යුතුය.

**කේ.එම්. මහින්ද සිරිවර්ධන**
**භාණ්ඩාගාර ලේකම්**

පිටපත්:

1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
4. විගණකාධිපති
5. ලේකම්, මුදල් කොමිෂන් සභාව